© සියලු ම හිමිකම් ඇවිරිණි අනු අංකය: ………………

# ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ සංගමය

## ශිල්පීය අදියර
## 2009 මාර්තු විභාගය

විභාග දිනය : 2009 මාර්තු 22 පිටු ගණන : 05
විභාග වේලාව : ප.ව. 1.30 - ප.ව. 4.30 ප්‍රශ්න ගණන : 09

<u>අයදුම්කරුවන්ට උපදෙස්:</u>

1. නියමිත කාලය පැය 3 කි.
2. I කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, II කොටසේ A කාණ්ඩයෙන් ප්‍රශ්න දෙකකට ද, B කාණ්ඩයෙන් ප්‍රශ්න දෙකකට ද උත්තර සපයන්න.
3. උත්තර එක් භාෂාවකින් (සිංහල) පමණක් ලියන්න.

| විෂය | විෂය සංකේතය |
|---|---|
| ආර්ථික විද්‍යාව හා ජාත්‍යන්තර ව්‍යාපාර | (ECN / 505) |

---

### I කොටස - බහුවරණ ප්‍රශ්න පත්‍රය

අංක 01 දරණ ප්‍රශ්නයේ සියලුම කොටස්වලට උත්තර සපයන්න. එක් එක් ප්‍රශ්නයට <u>වඩාත්ම නිවැරදි</u> උත්තරය තෝරන්න. එසේ තෝරාගත් උත්තරයට අදාළ ඉංග්‍රීසි අක්ෂරය ප්‍රශ්න අංකය සමග පිළිතුරු පොතේ ලියන්න. උදා: **(1) (a), (2) (b)** වශයෙන්.

**<u>ප්‍රශ්න අංක 01</u>** *<u>(ලකුණු 20)</u>*

(1) නිෂ්පාදන හැකියා මායිම යොදා ගැනීමෙන් පැහැදිලි කළ හැකි සංකල්පය වන්නේ:
- (a) ආවස්ථික පිරිවැය
- (b) සමතුලිත මිල
- (c) පාරිභෝගික අතිරික්තය
- (d) නිෂ්පාදන අතිරික්තය

(2) ආර්ථිකයක විශේෂ ප්‍රාගුණ්‍යය මට්ටම වැඩි කරගත හැක්කේ:
- (a) පරිගණක නිෂ්පාදකයෙකු ප්‍රචාරණ සමාගමක් අත්පත් කර ගැනීමෙන්
- (b) සිල්ලර ගබඩාවක් භාණ්ඩ ණයට විකිණීමෙන්
- (c) සංචාරක නියෝජිත ආයතනයක් ගුවන් තොටුපල දක්වාම ප්‍රවාහනය සැපයීමෙන්
- (d) වාහන එකලස් කරන්නෙකු තම වාහන පරාසය අඩු කිරීමෙන්

(3) බැංකු නෝට්ටු මුදල් වශයෙන් භාවිත වීමේ හේතුව වන්නේ:
- (a) ඒවා කල්පවතින බැවිනි
- (b) ඒවා ජාත්‍යන්තර වශයෙන් පිළිගන්නා බැවිනි
- (c) ඒවා වලංගු මුදල් වශයෙන් සළකන බැවිනි
- (d) ඒවාට නිසඟ අගයක් ඇති බැවිනි

(4) පහත සඳහන් ඒවායින් වාස්තවික (Positive) ප්‍රකාශය වන්නේ:
- (a) ධනවාදී අර්ථ ක්‍රමයේ දුර්වලතා රාශියක් ඇත.
- (b) රටේ ආර්ථික වර්ධන වේගය 5.5% කි.
- (c) තෙවැනි ලෝකයේ රටවල දිළිඳුකම බහුල වශයෙන් ඇත.
- (d) මිල පාලනය හා සලාක ක්‍රමය යොදාගැනීම ප්‍රයෝජනවත් ය.

(5) අභිමතානුරූපී (Normative) ප්‍රකාශයකින් පෙන්නුම් කරන්නේ:
   (a) කරුණක් ඔප්පු කිරීමට නිවැරදි දිනයක්
   (b) සත්‍ය කරුණු හා සංඛ්‍යා ලේඛන
   (c) යම්කිසි කෙනෙකුගේ පුද්ගලබද්ධ ඇගැයුම
   (d) ඔප්පු කරන ලද සත්‍ය හෝ අසත්‍ය ප්‍රකාශ

(6) පහත සඳහන් ඒවායින් ව්‍යවසායෙකුගේ කාර්ය භාරය වන්නේ:
   (a) එළඹී ඇති අවදානම් භාර ගැනීම
   (b) ශ්‍රමිකයින් කොපමණ ප්‍රමාණයක් යෙදිය යුතු ද යන්න
   (c) නිෂ්පාදන සාදක සංවිධානය කිරීම
   (d) භාණ්ඩයේ විකුණුම් ප්‍රවර්ධනය කිරීම

(7) අර්ථ ක්‍රම රටකින් රටකට වෙනස්වීමට හේතුව නම්:
   (a) ගැටලු විවිධ වීම
   (b) ගැටලු සමාන වීම
   (c) විසඳුම් විවිධ වීම
   (d) විසඳුම් සමාන වීම

(8) සංවර්ධනය දිරිමත් කිරීමේ ක්‍රමයක් වශයෙන් සැලසුම් අර්ථ ක්‍රමයකට වඩා නිදහස් වෙළඳපල අර්ථ ක්‍රමයක් වඩා වැදගත් වීමට හේතුව නම්:
   (a) සමාන ආදායම් තත්ත්වය දිරිමත් කිරීම
   (b) නිෂ්පාදන සම්පත් කාර්යක්ෂමව යොදාගැනීම
   (c) රාජ්‍ය මැදිහත්වීමෙන් බදු හා සහනාධාර යොදාගැනීම
   (d) සාමාජීය පිරිවැය සැළකිල්ලට ගැනීම

(9) පහත දැක්වෙන අයුරු කිසියම් ආර්ථිකයකට X භාණ්ඩ හෝ Y භාණ්ඩ හෝ X හා Y වල සංයෝගයක් නිපදවිය හැකි ය.




A සිට B දක්වා මාරුවන විට **X** හි වැඩිවීමේ ආවස්ථික පිරිවැය **Y** ආශ්‍රයෙන් දක්වන්න.
   (a) + ½
   (b) – 2
   (c) + 100
   (d) – 50

(10) පහත සඳහන් ප්‍රකාශවලින් මිශ්‍ර ආර්ථිකයක් සම්බන්ධයෙන් සත්‍ය ප්‍රකාශය කුමක් ද?
   (a) ප්‍රාථමික අංශය සඳහා ශ්‍රමිකයින් බහුල වශයෙන් රජය යොදා ගනී.
   (b) ද්විතීයක අංශයේ ප්‍රධාන කර්මාන්ත සියල්ල රජය සතුව පැවතීම.
   (c) ප්‍රවාහන ජාලය රජය නතුකරගෙන සිටීම.
   (d) රජය පොදු භාණ්ඩ සපයයි.

(11) බස්රථ රියදුරන්ගේ වැටුප් වැඩිවීම කෙරෙහි පහත සඳහන් ඒවායින් කුමක් බලපායි ද?

(a) ඔවුන්ගේ ඵලදායීතාවය වැඩිවීම

(b) බස් ධාවන මාර්ග ගණන අඩුවීම

(c) බස් රථවලින් ගමන් යන ජනයා අඩුවීම

(d) බස් රියදුරන්ගේ සැපයුම් සංඛ්‍යාව අඩුවීම

(12) ප්‍රතික්‍රමික බද්දක් වෙනුවට අනුක්‍රමික බද්දක් පනවනු ලැබුවහොත් බොහෝ දුරට ඇතිවිය හැකි තත්ත්වය පහත දැක්වෙන ඒවායින් කුමක් විය හැකි ද?

(a) පොහොසත් ජනයා විසින් ගෙවන බදු ප්‍රමාණය වැඩි වේ.

(b) බදු ගෙවූ පසු ආදායම අඩු වේ.

(c) බහුතර ජනයා සමාන බදු ප්‍රමාණයක්ම ගෙවයි.

(d) දුප්පත් ජනයා ගෙවන බදු ප්‍රමාණය වැඩි වේ.

(13) පහත සඳහන් ඒවායින් කුමක් මගින් ව්‍යවහාර මුදල් ක්ෂයවීම යනුවෙන් හැඳින්වේ ද?

(a) එහි බාහිර අගය අඩුවීම

(b) එහි අභ්‍යන්තර අගය අඩුවීම

(c) එහි බාහිර අගය වැඩිවීම

(d) එහි අභ්‍යන්තර අගය වැඩිවීම

(14) යුරෝපය වෙළඳ බාධක වැඩිකරනු ලැබුවහොත් ආසියාතික හා අප්‍රිකානු රටවල ඇඟලුම් හා ආහාර ද්‍රව්‍ය ආනයනය කෙරෙහි ඇතිවන බලපෑම පහත සඳහන් ඒවායින් කුමක් වේ ද?

(a) යුරෝපීය රටවලට තෝරාගැනීමේ වැඩි ඉඩක් ලැබීම

(b) යුරෝපීය නිෂ්පාදකයින්ගේ ආදායම වැඩිවීම

(c) යුරෝපීය රටවල ඇඟලුම් කර්මාන්තයේ සේවා වියුක්තිය අඩුවීම

(d) ආර්ථික වර්ධනය හෙමින් සිදුවීම

(15) නිෂ්පාදනයේ ස්ථාවර පිරිවැයක් වන්නේ පහත දැක්වෙන ඒවායින් කුමකින් ද?

(a) කර්මාන්තශාලාව සඳහා ගෙවන බදු හා වරිපණම්

(b) දුරකථනය පාවිච්චි කිරීමේ පිරිවැය

(c) තැන්පතු සඳහා ගෙවන පොලී

(d) අලුත්වැඩියා සඳහා ගෙවූ මුදල්

(16) ''ආර්ථික වර්ධනය සඳහා වූ ප්‍රතිපත්ති උද්ධමනය කෙරෙහි බලපායි''. පහත සඳහන් කවර ප්‍රකාශයක් ඊට ගැලපේ ද?

(a) ඒවා තරඟකාරීත්වය වැඩි කරයි.

(b) ඒවා ඉතිරිකිරීම් වැඩි කරයි.

(c) ඒවා ගෙවීම් වැඩි කරයි.

(d) ඒවා සේවා වියුක්තිය වැඩි කරයි.

(17) ආර්ථික වර්ධන වේගය අඩු කිරීම සඳහා රජය විසින් පහත සඳහන් ඒවායින් කුමන පියවරක් ගත යුතු ද?

(a) ආරක්ෂක වියදම් අඩු කිරීම

(b) භාණ්ඩ හා සේවා සඳහා බදු අඩු කිරීම

(c) බැංකු පොලිය වැඩි කිරීම

(d) ඍජු බදු අඩු කිරීම

(18) බහුජාතික සමාගමක් යන්න වඩාත් හොඳින් විස්තර කෙරෙන්නේ පහත දැක්වෙන ඒවායින් කවරකින් ද?

(a) රජයට අයිති සමාගමකි.

(b) බොහෝ කොටස්කරුවන් සිටින සමාගමකි.

(c) ජාත්‍යන්තරව වෙළඳාම් කරන සමාගමකි.

(d) එකකට වඩා වැඩි භාණ්ඩ ගණනක් නිපදවන සමාගමකි.

(19) වෛද්‍යවරුන් හතර දෙනෙකුගෙන් යුක්ත කණ්ඩායමකට වඩාත් සුදුසු ව්‍යාපාර සංවිධාන වර්ගය පහත දැක්වෙන ඒවායින් කුමක් ද?
   (a) හවුල් ව්‍යාපාරයක්
   (b) පෞද්ගලික සමාගමක්
   (c) පොදු සමාගමක්
   (d) පොදු සංස්ථාවක්

(20) ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් බලපාන්නේ පහත සඳහන් ඒවායින් කුමකින් ද?
   (a) ජාත්‍යන්තර වෙළඳ සල්පිල්
   (b) වෙළඳ ආරක්ෂණය
   (c) භාණ්ඩවලට භාණ්ඩ හුවමාරු කිරීමේ (Barter) ක්‍රමය
   (d) මුදල් පාවිච්චිය

*(ලකුණු 01 x 20 = ලකුණු 20)*

I කොටස අවසානයි

## II කොටස

**A අංශය**

**ප්‍රශ්න 02 කට පමණක් පිළිතුරු සපයන්න.**

**<u>ප්‍රශ්න අංක 02</u>** *(ලකුණු 20)*

(a) වෙළඳපල අර්ථ ක්‍රමය හා සැලසුම් අර්ථ ක්‍රමය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 10)

(b) සියලුම භාණ්ඩ හා සේවා රජය විසින් සැපයීම කෙතරම් උචිත දැයි විස්තර කරන්න. (ලකුණු 10)
(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක 03** *(ලකුණු 20)*

(a) භාණ්ඩයක වෙළඳපල සමතුලිත මිල තීරණය වන ආකාරය හා වෙනස්වන ආකාරය රූප සටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(b) අධි ඉල්ලුම හා අධි සැපයුම රූප සටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)
(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක 04** *(ලකුණු 20)*

(a) පූර්ණ තරඟකාරී වෙළඳපලක ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 10)

(b) පූර්ණ තරඟකාරී වෙළඳපල ආයතනයක කෙටි කාලයේ දී නිෂ්ප්‍රමාණික ලාභ ලැබිය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)
(ලකුණු 08)
(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක 05** *(ලකුණු 20)*

(a) ශ්‍රම විභජනය හා විශේෂ ප්‍රාගුණ්‍යයෙහි ප්‍රධාන වාසි ලැයිස්තුගත කරන්න. (ලකුණු 10)

(b) තනි වෙළඳ ව්‍යාපාර වෙනත් ව්‍යාපාර සංවිධානවලට වඩා ජනප්‍රිය වීමට හේතු පැහැදිලි කරන්න.
(ලකුණු 10)
(මුළු ලකුණු 20)

A අංශය අවසානයි

**B** අංශය

ප්‍රශ්න 02 කට පමණක් පිළිතුරු සපයන්න.

**<u>ප්‍රශ්න අංක 06</u>** *<u>(ලකුණු 20)</u>*

(a) ප්‍රධාන විදේශ විනිමය අනුපාත වර්ග පැහැදිලි කරන්න. (ලකුණු 10)

(b) පාවෙන විනිමය අනුපාතය වඩාත් සුදුසු වන්නේ ඇයි ද යන්න විස්තර කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 07</u>** *<u>(ලකුණු 20)</u>*

(a) රටක ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිණුමේ හිඟයක් ඇත. මෙය නිවැරදි කළ හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

(b) ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිණුමේ හිඟය විසඳීමට ශ්‍රී ලංකාව විසින් අනුගමනය කළ ව්‍යුහගත වෙනස් කිරීම් විස්තර කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 08</u>** *<u>(ලකුණු 20)</u>*

(a) උද්ධමනයට ප්‍රධාන හේතු විස්තර කරන්න. (ලකුණු 10)

(b) උද්ධමනය පාලනය කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 09</u>** *<u>(ලකුණු 20)</u>*

(a) සියලුම රටවල් ආර්ථික වර්ධනයක් ලබාගැනීමට බලාපොරොත්තු වන්නේ ඇයි ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 10)

(b) ආර්ථික වර්ධනයේ ප්‍රතිවිපාක විස්තර කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 20)

B අංශය අවසානයි

II කොටස අවසානයි

ප්‍රශ්න පත්‍රය අවසානයි